මගේ අංකය: පි.එච්/4042/ඊ
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10

2004.05.25

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක.06/2004

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම - 2004

2004 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත සඳහන් පදනම මත විශ්‍රාමික රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

(අ) 1996.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ගෙන 2004.01.01 දින වන විට විශ්‍රාම වැටුප ලබමින් සිටින විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.

(ආ) විශ්‍රාමිකයා තම තනතුරෙහි/ සේවයෙහි 1996.12.31 දිනට අදාළ වැටුප් ක්‍රමයෙහි සිටියා සේ සළකා එම පදනම මත විශ්‍රාම වැටුප් ගණන් බලා සංශෝධනය කිරීම.

(ඇ) මෙම විශ්‍රාමිකයින්ගේ වැටුපට අදාළ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය ඇමුණුම - 1 හි දැක්වෙන 1996.12.31 දිනට අදාළ සාමාන්‍ය විශ්‍රාම වැටුප් ප්‍රතිශතය ලෙස සැළකීම

(ඈ) 1996 න් පසු අනුමත දීමනා සහ වෙනත් වැඩිකිරීම් තවදුරටත් ගෙවීම

02. මේ අනුව 1996.12.31 දිනට පෙර සියළුම විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප් 1996.12.31 දින විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප හා සම මට්ටමට ගෙන එනු ලැබේ. 1996.12.31 දිනට අදාළ වැටුප් ක්‍රම ඇමුණුම 2 - හි ඇත. යමෙකු විශ්‍රාම ගත් දිනයේ සිට 1996.12.31 දින දක්වා අතර කාලයට සේවා උසස් කිරීම්, වැටුප් වර්ධක [illegible] කිරීමේ වැනි කිසිවක් මෙම ගණනය කිරීම සඳහා අදාළ කර ගතයුතු නොවේ.

03. (අ) මෙහිදී විශ්‍රාමිකයා විශ්‍රාම ගන්නා දිනට ලැබූ වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවර 1996.12.31 දින වැටුප් පියවරට කල්පිත පදනමක් මත පරිවර්තනය කළ යුතුය. ඒ සඳහා ඇමුණුම 2 හි උපලේඛනය අදාළ කරගත යුතුය.

(ආ) ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය වැනි සේවා සම්බන්ධයෙන් අදාළ සේවා ව්‍යවස්ථාවලට අනුකූලව නියමිත ශ්‍රේණියට අනුරූපී 1996.12.31 දිනට අදාළ වැටුප් පියවරෙහි තබා විශ්‍රාම වැටුප් සංශෝධනය කළයුතු වේ.

/..02

(ඇ) ත්‍රිවිධ හමුදා වලින් විශ්‍රාම ලැබූවන් සම්බන්ධයෙන් හමුදා මූලස්ථාන විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් අනුව ආධාර කර ගනිමින් එම වැටුප් පරිමාණයේ වැටුප් පියවරට අනුරූපී 1996.12.31 දිනට අදාළ වැටුප් පියවරෙහි තබා විශ්‍රාම වැටුප් සංශෝධනය කළ යුතු වේ.

04. සංශෝධිත විශ්‍රාම වැටුප් සඳහා සුදුසුකම් ලබන එක් එක් විශ්‍රාමිකයාගේ සංශෝධිත විශ්‍රාම වැටුප ගණන් බැලීම ඔවුන්ගේ ලිපිගොනු අධ්‍යයනය කිරීම මගින් කළ යුතු වේ. විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ද මධ්‍යගතව මහා භාණ්ඩාගාරයේ හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු මට්ටමින් ද පරිගණක ගත කළමනාකරණ තොරතුරු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංශෝධන සඳහා ඇමුණුම 3හි ඇති පෝරමය පිටපත් 02කින් පුරවා එක් පිටපතක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

05. යම් විශ්‍රාමිකයකු ලැබූ විශ්‍රාම වැටුප සංශෝධිත විශ්‍රාම වැටුපට වඩා වැඩි නම් ඔහුගේ පැවැති විශ්‍රාම වැටුප තවදුරටත් ලබාගත හැක.

06. මෙම චක්‍රලේඛයේ ප්‍රකාර හිඟ මුදල් ගෙවීම 2004.01.01 දින සිට පමණක් සිදු කළ යුතුය.

07. විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා පදනම් කරගත යුතු අනුරූපී වැටුප හඳුනා ගැනීමට නොහැකිවීම වැනි ප්‍රශ්නයකදී අදාළ තොරතුරු සමග 10, මාලිගාවත්ත, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂිකා, එන්.අශයවික්‍රම මහත්මිය වෙත වහාම යොමු කරනු මැනවි. ඇයගේ ෆැක්ස්/දුරකථන අංකය 2432008 වේ.

08. රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ජේ.ඒ.තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ.

පිටපත්:

1. අමාත්‍යාංශ ලේකම්වරුන්
2. විගණකාධිපති
3. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්

යිරි/=

## Percentage Chart for Computation of Pensions of those who retire as from 24.12.1996

| Annual salary received at retirement | 25 Yrs. | | 25 Yrs. 6 mths. | | 26 Yrs. | | 26 Yrs. 6 mths. | | 27 Yrs. | | 27 Yrs. 6 mths. | | 28 Yrs. | | 28 Yrs. 6 mths. | | 29 Yrs. | | 29 Yrs. 6 mths. | | 30 Yrs. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. | Un Red. | Red. |
| | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| Less than Rs. 25440 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 | 90 | 85 |
| 25441 – 26460 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 |
| 26461 – 28740 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 |
| 28741 – 30060 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 |
| 30061 – 31720 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 |
| 31741 – 41280 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 |
| 41281 – 55920 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 |
| 55921 – 66840 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 |
| 66841 – 71040 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 |
| 71041 – 101400 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 |
| Over Rs. 101400 | 75 | 65 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 |